| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | **02** | 11. | **03** | 21. | **01** | 31. | **01** |
| 02. | **02** | 12. | **04** | 22. | **01** | 32. | **02** |
| 03. | **01** | 13. | **02** | 23. | **03** | 33. | **01** |
| 04. | **04** | 14. | **03** | 24. | **04** | 34. | **02** |
| 05. | **04** | 15. | **02** | 25. | **04** | 35. | **03** |
| 06. | **02** | 16. | **01** | 26. | **01** | 36. | **04** |
| 07. | **04** | 17. | **02** | 27. | **02** | 37. | **02** |
| 08. | **01** | 18. | **04** | 28. | **03** | 38. | **04** |
| 09. | **03** | 19. | **03** | 29. | **02** | 39. | **04** |
| 10. | **01** | 20. | **02** | 30. | **04** | 40. | **01** |

**විෂය අංකය - 50** **විෂයය - නාට්‍ය හා රංග කලාව**

**අ.පො.ස (සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 03**

**II පත්‍රය - පිළිතුරු**

01.

I. ප්‍රියංගනී, උමතු භාවයට පත්වීම (ලකුණු 02)

II. කරුණාරත්න. (ලකුණු 02)

III. ගගනිකාව මත දර්ශනය වන ටවර් කුලුණ, නිවසේ ආලින්දය ගෘහ උපකරණවලින් පෙන්වීම, හිල්ඩාගේ කන්තෝරුව, රාජගිරියේ බෝ ගහ නිරූපණය, ආදී කරුණු දෙකක් දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු02)

IV. පහත ස්ථාන අතරින් 2ක් සඳහන් විය යුතු ය.
- 2 ජවනිකාව - නැටුම් ගුරුතුමියගේ ගෙදර
- 3 ජවනිකාව - ප්‍රියංගනීගේ ගෙදර
- 4 ජවනිකාව - සම්පත්ගේ ගෙදර
- 5 ජවනිකාව - හිල්ඩාගේ කන්තෝරුව
- 8 ජවනිකාව - ටියුෂන් පන්තිය
- 9 ජවනිකාව - පාසල (ලකුණු 02)

V. කෙටි දර්ශන ක්ෂණිකව වෙනස් වීම, වේදිකා පසුතල අවම වීම, සංකේත යොදා ගැනීම, නළු නිළි රංගනයන් පමණක් මතුකිරීම, අදහස් ප්‍රකාශකිරීම සඳහා ගීත හා නර්තනය යොදා ගැනීම ආදී කරුණු දෙකක් දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

VI. සරත් සූරසේන (ලකුණු 02)

02. (I) නාට්‍යය දර්ශනයක් නැරඹීම සඳහා විශේෂයෙන් සුදානම්ව පැමිණෙන පුද්ගලයා වේ. (ලකුණු 02)

(ii) විචාරකයෙකු, රසිකයකු, විනිශ්චයකරුවකු ආදී කරුණු දෙකක් දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

(iii)
- ❖ නාට්‍යයට අවශ්‍ය අංගත්‍රයෙන් එකකි.
- ❖ නාට්‍යයේ ඉදිරිගමන තීරණය කරන්නා වේ.
- ❖ ප්‍රේක්ෂක ප්‍රතිචාර මත නාට්‍ය වෙනස් වූ අවස්ථා ද ඇත.
- ❖ ප්‍රේක්ෂකයා නොමැතිනම් නාට්‍යයක් නැත.
- ❖ නාට්‍යය පිළිබඳ තක්සේරු කරන්නා වේ.
- ❖ ආදි කරුණු තුනක් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

03. (I) චරිතාංග අංගරචනය (ලකුණු 02)

(ii) නළල, ඇස, නාසය, කට, නිකට, කම්මුල්. (ලකුණු 04)

(iii)
- ❖ ආලෝකය හොඳින් වැටෙන සුදුසු ස්ථානයක් තෝරාගැනීම
- ❖ අංගරචනා ද්‍රව්‍ය පිළිවෙළින් තබා ගැනීම
- ❖ චරිතය සඳහා පෙනී සිටින පුද්ගලයාගේ මුහුණ තෙත ස්පොන්ච් එකකින් පිරිසිදු කිරීම
- ❖ අංග රචන ශිල්පියා ද තම දෑත් පිරිසිදු කරගැනීම
- ❖ නිරූපණ ශිල්පියාගේ සමෙහි වර්ණයට ගැළපෙන පදනම් ආලේපය ගැල්වීම
- ❖ චරිතයට අදාළ ව චරිත ලක්ෂණ මතුවෙන පරිදි උචිත වර්ණ යොදා අංග රචනය සිදුකිරීම
- ❖ අංග රචනයෙන් පසු ආරක්ෂිත ආලේපන යෙදීම (පවුඩර් පෆ් යෙදීම)
- ❖ රංගනයෙන් පසු අංගරචනය ඉවත්කිරීම, ආදී කරුණු පිළිවෙළින් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ලකුණු 06)

04. (I) බෙරහඬ (ලකුණු 02)

(ii) දියසේන නොපැමිණීම, ස්වර්ණමාලි, ස්වර්ණ හංස, සෝෂක වස්තුව. (ලකුණු 04)

(iii)
- ❖ හැටේ දශකයේ නාට්‍යවේදියෙකි
- ❖ අනුවර්තන හා පරිවර්තන රැසක් නිර්මාණය කිරීම
- ❖ විචාර ග්‍රන්ථ රචනා කිරීම
- ❖ ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණය කර ඇත
- ❖ විදේශීය නිර්මාණකරුවන්ගේ කෘති මෙරට ප්‍රේක්ෂකයන්ට රස විඳීමට අවස්ථාව ලැබීම
- ❖ නළු නිළියන් ඇතුළු ශිල්පීන් රැසක් මෙතුමාගේ නාට්‍ය නිර්මාණ තුළින් නාට්‍ය කලාවට දායාද වීම

. (ලකුණු 06)

05. (I) ශිල්පියා තමාගේ පෞද්ගලික ස්වරූපය මොහොතකට අමතක කර දමා වෙනත් චරිතයකට ආරෝපනය විමයි. (ලකුණු 02)

(ii) අභ්‍යන්තර සමාරෝපය හා බාහිර සමාරෝපය

අභ්‍යන්තර සමාරෝපය යනු තමන්ට අයත් චරිතයට මනසින් ප්‍රවිෂ්ට වීමයි.

බාහිර සමාරෝපය යනු තමා මනසින් ප්‍රවිෂ්ට වූ චරිතය බාහිර ලක්ෂණ යොදා ගෙන රංගනය කර පෙන්වීමයි. ආදි කරුණු විස්තරාත්මකව දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

(iii) ඉහත සඳහන් කළ කාරණා නිදසුන් සහිතව විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

06. (I) නාට්‍ය පෙළ රංගයක් බවට පත්කරන්නා ය. (ලකුණු 02)

(ii) ක්ෂණික නිරූපණයක් දීම
පිටපතකින් කොටසක් දී,
ගායන රංගන හැකියාව ඉදිරිපත් කිරීමට අවස්ථාව දීම
සූදානම්ව පැමිණි නාට්‍යය කොටසක් දීම (ලකුණු 04)

(iii) පිටපත තෝරා ගැනීම, අධ්‍යක්ෂණ පිටපත සකස් කිරීම, නළුවරණය, ආනුෂංගික ශිල්පීන් තෝරා ගැනීම, නාට්‍යයට සම්බන්ධ වන සියලු ශිල්පීන් සමග පිටපත සාකච්ඡා කිරීම හා කාර්යයන් පැවරීම, දෙබස් පුහුණුව, නාට්‍ය පුහුණුව, කාර්මික පුහුණුව, සවේශ පුහුණුව, මංගල දර්ශනය

ආදී කරුණු පිළිවෙළින් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06 )

07) ප්‍රශ්නයට අදාළව පසුබිම, කාලය හා චරිත ගොඩනගමින් රංග විධාන හා සංවාද සහිතව චරිත අතර ගැටුමක් මතු වන අයුරින් දෙගිඩියාව කුතුහලය, උත්ප්‍රාසය සහිතව නාටෝචිත අවස්ථා ගොඩනගා තිබීම අපේක්ෂා කෙරේ.

ඒ අනුව,

(I) රංග විධාන සහිත සංවාද ගොඩනගා තිබීම (ලකුණු 04 )

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් පෙළ සකස් කිරීම (ලකුණු 04 )

(iii) දෙගිඩියාව කුතුහලය, උත්ප්‍රාසය සහිතව නාටෝචිත අවස්ථා නිර්මාණය කර තිබීම (ලකුණු 04)

ප්‍රශ්න 2 සිට 6 දක්වා පිළිතුරු සැපයීමේ දී iii කොටසට සම්පූර්ණ ලකුණු ලබා දීමට නම් අවම වශයෙන් කරුණු තුනක්වත් විස්තර කිරීම අපේක්ෂා කෙරේ.

******